# ජීවිතයට නව අර්ථ කථනයක් ලබාදෙන්න



ඔබ ඇඳුම් කඩයකට ගියාම එහි ලේබල් ගහලා තියෙනවා " පොඩි ළමයිගේ ඇඳුම්", " කාන්තාවන්ගේ ඇඳුම්", "නව විලාසිතා", "කාර්යාල ඇඳුම්" යනාදී වශයෙන්. ඒක දැක්කම අපිට තේරෙනවා එම ලේබලය යටතේ තියෙන්නේ එම විස්තරයට අදාල ඇඳුම් පමනයි කියලා.

මිනිසුන් ලගත් ලේබල් තියෙනවා. "මම කලු කොට කෙනෙක්", "මම දුප්පත් කෙනෙක්, "මට කිසි දෙයක් මතක නෑ". "මම ඉහලට ඉගෙන ගෙන නෑ ". "මම හරි අවාසනාවන්ත කෙනෙක". "මට පටන් ගත්ත කිසිම දෙයක් ඉවර කරන්න බෑ වගෙ" ලේබල් අපි ලග තියෙනවා. එක්කෝ අපිම මේ ලේබල් ගහගෙන, නැත්නම් අනිත් අය අපිට ලේබල් ගහලා අයින් කරලා.

හැබැයි අභියෝගය තියෙන්නේ මේ ලේබලයෙන් එලියට යන එකයි. එහෙම අභියෝග ජයගත්ත අය ඕනෑතරම් ඉන්නවා. ඔදප ක්‍රමසජ෴ කියන ලෝක ප්‍රසිද්ධ නලුවා "කිසිම දෙයක් මතක තියාගන්න බැරි" ලේබලය යටතේ හිටපු කෙනෙක්. ධවර් උසබරෙ෴හ කියන අද ලෝකයේ ඉතාම ධනවත් ප්‍රභල කාන්තාව "ඉතාම දුප්පත් කලු ජාතික වරප්‍රසාද අහිමි" කියන ලේබලය යටතේ ඉඳලා එයට අභියෝග කරමින් ලේබලයෙන් ඉවතට ආපු කෙනෙක්.

මොහොතක් හිතන්න ඔබ ඔබටම දමාගෙන තිබෙන හෝ අනිත් අය ඔබට ලබාදී තිබෙන ලේබල් මොනවාද? ඒ ලේබල් නිසා ඔබගේ ජීවිතය කොතරම් සිමාවී තිබෙනවද? එම ලේබලය අයින් කර, නිදහස් උනොත් ඔබට කොයිතරම් දුරක් යා හැකිද?

ඔබ දැකලා ඇති, එහෙම නැත්නම් අහලා ඇති රූකඩ නැටුම් ශිල්පීන්. මෙම රූකඩ නැට්ටුවාව මෙහෙයවන්නේ වෙන කෙනෙක්. ඒ කෙනා නූල් අදින විදියට තමයි, මේ නැටුම් ශිල්පියාගේ ශරීරයේ අවයව සෙලවෙන්නේ. එම මෙහෙයවන්නා එක නූලක් ඇද්දහම, නැට්ටුවාගේ එක අතක් ඉස්සෙනවා. අනිත් නූල ඇද්දහම නැට්ටුවාගේ ඔලුව ඉස්සෙනවා. මේ විදියට අර මෙහෙයවන්නා නූල් අදින අදින පැත්තට නැට්ටුවාගේ ශරීරය සෙලවීමක් සිදුවන නිසා නැටුමේ සම්පූර්ණ පාලනය තියෙන්නේ මෙහෙයවන්නාට මිසක් නැට්ටුවාට නෙමෙයි.

සාමාන්‍ය නැට්ටුවාගෙයි, රූකඩ නැට්ටුවාගෙයි වෙනස තියෙන්නේ, සාමාන්‍ය නැට්ටුවා වැයෙන තාලයට අනුව පාද තබන්නේත්, ඇඟ හැඩ කරමින් රඟන්නේත් තමාම එහි පාලනය අරගෙනයි. රූකඩ නැට්ටුවා නටන්නේ පිටත ඉඳන් නූල් අදින මෙහෙයවන්නගෙ පාලනයටයි . නූල් අදින පැත්තට ඇදෙනවා. නූල් ටික අත ඇරියොත් කඩාගෙන බිමටම වැටෙනවා.

ඔබේ ජීවිතය පාලනය කරන්නේ කවුද? ඔබත් අනිත් අය කියන කියන දේ කරමින්, ඔවුන් නූල අදින පැත්තට යන කෙනෙක්ද? අපි එක ඉලක්කයක් හිතට අරගෙන, එක අරමුණකට ගමනක් යනකොට විවිධ පුද්ගලයන් වගේම විවිධ සිදුවීම සිද්දවෙනවා අපව වෙන අරමුණු වලට යොමුකරවන.

## නිදහසට කාරණා කීම නතර කරන්න

නිදහසට කාරණා කීම යනු අපේ "හය" ප්‍රකාශ කරන තවත් විදියක්. අපි කියනවා "මට හයයි මේක වැරදියි කියලා, මට හයයි අනිත් අය මංගැන වැරදියට හිතයි කියලා. මට හයයි මං අසාර්ථක වෙයි කියලා. මට හයයි වටපිට ඉන්න අය මට හිනාවෙයි කියලා". ඔබට වැඩක් ආරම්භ කිරීමට ප්‍රථම එහෙම හිතෙන එකින් වැරැද්දක් නෑ. හේතුව එම කාර්යය ආරම්භ කරන මොහොත්දී එය සාර්ථකව නිම කරන්න පුලුවන් වේවිද කියලා, ඔබ හරියටම දන්නේ නැ. කවුරුහරි ඔබට කිව්වොත් "ඔය වැඩේ ඉතාම සාර්ථක වෙනවා. කොහොමටත් වරදින්නේ නෑ. ඒ නිසා පටන්ගන්න කියලා". ඔබ ඒ වැඩේ බොහොම සන්තෝෂයෙන් කරාවි.

දවසක් බොහෝම සීලවන්ත, මාගීඵල ලාභී භික්ෂුන් වහන්සේ කෙනෙකුට තමන්ගේ අත පෙන්නලා කෙනෙක් අහනවා "මගේ අත දිහා බලලා නිශ්චිතවම මගේ අනාගයේ මොනවද වෙන්නේ කියලා මට කියන්න කියලා". අත දිහා බලපු ස්වාමින් වහන්සේ කියනවා " මට නිශ්චිතවම කියන්න පුලුවන් ඔබගේ අනාගය හරිම අවිනිශ්චිතයි කියලා" මෙන්න මේ නිසා ඕනෑම කෙනෙකුට අලුත් දෙයක් කරන්න යාමේදී මේක හරියයි ද නැද්ද කියා හය, අවිනිශ්චිත හව එනවා. ඒ හය තියාගෙන තමයි හැමදෙනාම කටයුතු කලේ. නමුත් එම කාර්යය හරියටම සාර්ථක වන බවට ඔබතුල තිබෙන දැඩි විශ්වාසය සියළු සාධක ජයගන්න තරම් සමත්වෙනවා. එම විශ්වාසය ඇතිකරගෙන ජීවිතයට මුහුනදෙන්න.

## පළමු පියවර අද අරගන්න.

ජීවිතයේ ඉලක්කයක් ලගා කරගැනීමේ පළමු පියවර ලෙස හඳුන්වන්නේ එම ඉලක්කය පිළිබඳ සිතේ මවාගැනීමයි. එහෙම නැත්නම් ඒ පිළිබඳ සිහින දැකීමකි. මේ පියවර සම්පූර්ණ කරගත්ත හුඟ දෙනෙක් ඉන්නවා. හැබැයි සිහින සැබෑ කරගන්න අය ඉන්නේ ටික දෙනයි. ඇයි එහෙම වෙලා තියෙන්නේ? හේතුව තමයි එම සිහිනය සැබෑ කරගන්න අවශ්‍ය ක්‍රියාවලියේ පළමු පියවර නොගැනීම. එහෙමත් නැත්නම් එම පියවර ගැනීම විවිධ හේතූන් මත කල්දැමීමයි.

ලෝකය මවිත කරවන මහා නිර්මාණ බිහිවුනෙත්, අදහාගැනීමට පවා නොහැකි විශිෂ්ඨ නිර්මාණ බිහිවුනෙත් එක දවසකින් දෙකකි න්වත් එකවර වත් නොවේ. දිනපතා - සතිපතා - මාස්පතා - අවුරුදු පතා නොකඩවා කරගෙන ආ දේවල් වල ප්‍රතිඵලයෙනි.

ඔබ තව අවුරුදු 5 කින් ලබාගැනීමට අපේක්ෂා කරන ඉලක්කය වෙනුවෙන් පළමු පියවර අද ගන්න. ඔබේ පොතේ පළවන වාක්‍යය ලියන්න අද ආරම්භ කරන්න. අපි අතර ඉන්නවා හුඟ දෙනෙක් අවශ්‍ය සිහිනය හිතේ මවාගෙන, පළමු පියවර තැබීමට සැකයෙන් එයට අවශ්‍ය පරිසර සැකසෙන තුරු අවුරුදු ගනනාවක් බලාගෙන ඉන්න අය

පළමු පියවර තැබීමෙන් ඔබ කලේ ඔබේ ඉලක්කයට එක පියවරකින් ලගාවීමයි. ඔබේ අලුත් ඉලක්කය නව රැකියාවක් සොයාගැනීම, පාඨමාලාවක් හැදෑරීම, නිවසක් තනාගැනීම, නව වාපාරයක් ආරම්භ කිරීම, ඉතිරිකිරීමක් ආරම්භ කිරීම එහෙමත් නැත්නම් විදේශ රටකට සංචාරය කිරීම වැනි ඕනෑම දෙයක් වෙන්න පුලුවන්. බැලූ බැල්මට සමහර විට ඔබට හිතේවි මෙය ලගා කරගත නොහැකි ඉතාම අපහසු කටයුත්තක් ලෙස. ඒ වගේම ඔබට පෙනෙයි එය ලගා කරගැනීමේ මාවත හරිම අපහැදිලි බව. නමුත් මෙලෙසින්ම සිහින දකිමින් පමණක් ඉන්න අනිත් අයගෙන් ඔබ වෙනස් වීමට නම් පළමු පියවර අරගන්න. එවිට ඔබට දෙවැනි, තුන්වැනි පියවර පැහැදිලිව පේන්න පටන් ගනීවි. ඔබ නොදැනුවත්ව ඔබේ ඉලක්කයට ලගාවේවි.

ඔබේ ජීවිතයට නව අර්ථ කථනයක් ලබාදෙන්න. ඔබෙ අරමුණ කරා ලගාවීමට ඔබට ඇති හැකියාව ගැන විශ්වාස කරන්න.



**නුවන් සමරපති**
පුද්ගල සංවර්ධන පුහුණුකරු
කතෘ - U Turn- ග්‍රන්ථය
Master Practitioner NLP- (USA)
Bachelor of Commerce - Marketing -( AUS)
Master Practitioner Hypnotherapy –(USA)
DIP in Sports Psychology - (UK)
nuwancsan@gmail.com

ADVICE ON LEGAL MATTERS

GATEWAY LAWYERS

Senanie Kurukularatne
Barrister & Solicitor
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

Business & Commercial Law
Sale & Purchase of Busines | Leases | Franchises
Conveyancing
Residential, Commercial & Rural
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions
Probate & Testamentary
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration
Family Law
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements
Migration Law
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
17 Glenview Rise Berwick VIC 3806 Australia
Tel +61 3 8786 9682
Fax +61 3 8786 9681
Mobile +61 414 660 513
info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au